# හල්ගොල්ල වතු බංගලාව ආශ්‍රිත කාර්මික උරුමය පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සී. ජයසිංහ**[1]

ප්‍රමුඛ පදඃ හල්ගොල්ල වත්ත බංගලාව, කාර්මික උරුමය, යටත් විජිත අවධි, කුරුණෑගල දිස්ත්‍රික්කය, වාස්තු විද්‍යාත්මක

## හැඳින්වීම

ඉංග්‍රිසි යටත් විජිත අවධියේ නිර්මාණය වූ හල්ගොල්ල වත්ත බංගලාව ලංකේය කාර්මික උරුමයේ සැලකිය යුතු වටිනාකම් රාශියක් ශේෂ කරමින් මධ්‍යම හා වයඹ පලාත් මායිම් කරන මැටිබොක්ක ප්‍රදේශය තුළ පිහිටා තිබේ. බ්‍රිතාන්‍ය අවධියේ දී මෙරටට පැමිණි බෙල්ජියම් ජාතිකයෙකු වූ ඒ.ජේ. වැඩර්පූටන් විසින් ගොඩනංවන ලද හල්ගොල්ල වත්ත බංගලාවේ විකාශනය හා ශේෂිත කාර්මික උරුමයන් පිළිබඳ මෙකී පර්යේෂණයෙන් විමසයි. ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය සම්බන්ධයෙන් පූර්ව පර්යේෂණ වැඩිමනක් කඳුකර කලාපය කෙරෙහි අවධානය යොමුකර ඇති අතර යටත් විජිත අවධියේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිර්මාණය වූ වතු බංගලා හා ඒවායේ කාර්මික උරුම කෙරෙහි අවධානය යොමුකර ඇත්තේ සුළුවෙනි. එකී හිදැස පිරවීම උදෙසා මෙම අධ්‍යයන සිදුකරන අතර බංගලාව ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් සහ කාර්මික උරුමය පිළිබඳ සාකච්ඡා කරමින් ලාංකේය යටත් විජිත උරුම පිළිබඳ අවබෝධ කරගැනීම පර්යේෂණයේ අරමුණ විණි.

## ක්‍රමවේදය

හල්ගොල්ල වත්ත බංගලාව මූලික කර සිදුකරන මෙම පර්යේෂණයට අදාල දත්ත රැස්කිරීම ප්‍රාථමික හා ද්විතීක මුලාශ්‍රය ඔස්සේ සිදුකරන ලදි. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රමුඛව කළ අතර එයින් හල්ගොල්ල බංගලාවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා කාර්මික උරුමය නිරීක්ෂණය කරන ලදි. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ද පර්යේෂණයට අදාල දත්ත වැඩි ප්‍රමාණයක් රැස්කර ගන්නා ලදි. එය හල්ගොල්ල වත්ත බංගලාවේ සිටින සේවක මණ්ඩලය, ප්‍රාදේශිය ප්‍රජාව සහ වැන්ඩපූටන් පවුලේ සාමාජිකයන් ඔස්සේ සිදුකරන ලදී. ද්විතීක මූලාශ්‍රය ඔස්සේ පර්යේෂණයට අදාල දත්ත රැස්කර ගනු ලැබුවේ ලේඛනාගාර ඔස්සේ ය. එහිදී වැන්ඩපූටන් පවුල සම්බන්ධයෙන් තතු පවතින වාර්තා, සිතුවම් හා ඡායාරූප භාවිත කරන ලදී.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
janithjayanath7@gmail.com

ඉහත ආකාරයන්ට රැස්කළ ලද දත්ත කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් යටත් විජිත යුගයේ බංගලා සමඟ සසඳා සංසන්දනාත්මක විශ්ලේෂණයෙන් අධ්‍යයනය කරන ලදී. ඊට අමතරව පැරණි උරුමය ප්‍රතිනිර්මාණය කිරීමට වාචික ඉතිහාසය සහ ලේඛනාගාර ඔස්සේ ලබාගත් දත්ත තේමාගත විශ්ලේෂණයට බඳුන් කරමින්ද අධ්‍යයනය සිදුකරන ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

බ්‍රිතාන්‍ය යටත් විජිත අවධියේදී මෙරටට පැමිණි විදේශිකයන් නොයෙක් ක්ෂේත්‍රවල නිරත විණි. එලෙස පැමිණි විදේශිකයෙකු ලෙස බෙල්ජියම් ජාතික ඒ.ජේ වැන්ඩපූටන් පෙන්වාදිය හැකිය. මොහු බෙල්ජියම තුළින් Stained glass කර්මාන්තයේ නියැලුණ ද ලංකාවට පැමිණීම රදලයන් උදෙසා ණයට මුදල් දීම සිදුකරන ලද්දේ රදල ඉඩම් ඇපයට තබා ගනිමිනි. එම මුදල් ලබාදීමට නොහැකි වීම මත විශාල ඉඩම් ප්‍රමාණයක් තමා සතු කර ගැනීමට ඔහුට අවස්ථාව උදාවූ අතර 1949 වන විට ශ්‍රී ලංකාවේ ධනවත් පුද්ගලයා ඒ.ජේ වැන්ඩපූටන් බව මයිකල් රොබට් ප්‍රකාශකළ බව මොනිකා වැන්ඩපූටන් සමඟ සිදුකළ සාකච්ඡාවෙන් තහවුරු විණි. නමුත් හල්ගොල්ල වතුයාය වැන්ඩපූටන් ඉංග්‍රීසි ජාතිකයෙකුගෙන් මිලදී ගත් ඉඩමක් වන අතර එම ඉඩම පදනම් කර ගනිමින් ඔහු වතුයාය සහ බංගලාව නිර්මාණය කරන ලදී. හල්ගොල්ල වතුයාය ආරම්භයේ දී වගා කරන ලද බෝගය වූයේ කොකෝවා වන අතර රබර්, සාදික්කා වැනි බෝග පසු වගා විය. වර්තමානයේ කෝපි, කුරුඳු, ගම්මිරිස්, කරාබු වැනි භෝග ද වගා කරයි. 1870 දශකයේ දී අක්කර දෙදාහක භූමි භාගයක හල්ගොල්ල වතුයාය හා බංගලාව ඉදිකර තිබෙන අතර එමිල් වැන්ඩපූටන් වත්මන් බංගලාවේ භාරකරු වේ.

අඩි එකහමාරක පළලකින් යුතු බිත්ති මධ්‍යයේ බංගලාවේ දොර හා ජනෙල් ඇති අතර ඒවායේ වසර සියයකට වඩා පැරණි විවිධ වර්ණවල Stained glass යොදා තිබේ. මෙම Stained glass බෙල්ජියමෙන් ආනයනය කරන ලද අතර ඒවායේ නිෂ්පාදන සමාගම වැන්ඩපූටන් ස්ටුඩියෝ විණි. Stained glass බ්‍රිතාන්‍ය අවධියේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද හඳුරුක්කන්ද, මීතැන්වල, පිටකන්ද ආදී බංගලාවල දක්නට නොලැබේ. එබැවින් බංගලාවේ ජනෙල් හා දොර කවුළු වලට සවිකරන ලද වීදුරු වැදගත් ගෘහ නිර්මාණ ශිල්පයක් ලෙස අනෙකුත් බංගලාවන් සමඟ සැසඳීමේ දී පෙනීයයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට ශේෂව පවතින යටත් විජිත බංගලා අතරින් දෙමහල් ඉදිකිරීමක් පවතින එකම බංගලාව හල්ගොල්ල බංගලාව බව අධ්‍යයනයෙන් තහවුරු විණි. එසේම විවේකය සහ විනෝදාස්වාදය ලබා ගැනිම උදෙසා ඉදිකළ පුළුල් ආලින්දය, බංගලාව අභ්‍යන්තරය සිසිල්ව තබා ගැනීමට උපකාර වන උස් සිවිලිම් සහ ස්වාභාවික ආලෝකය, වාතය අවශ්‍ය තරම් ඇතුළු කරගත හැකි විශාල ජනේල ආදිය හල්ගොල්ල බංගලාවේ දැකගත හැකි මූලික වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන් විය.

හල්ගොල්ල බංගලාවේ පවත්නා වැදගත් පැරණි උරුමයක් ලෙස වයින් ඔරලෝසුව හඳුනාගත හැකිය. එය එංගලන්තයේ "තොම්සන්" සමාගමට අයත් අතර බංගලාව ආරම්භයේ පටන් පවතින්නකි. බංගලාවේ ඇති පැරණි සිතුවම් හා ඡායාරූප විශේෂ වන්නේ ඒවා වසර සියයකට වඩා පැරණි නිසාවෙනි. එම සිතුවම් අතර ඒ.ආර් වැන්ඩපූටන් හා ඔහුගේ බිරිඳගේ සිතුවම් ප්‍රමුඛ වේ. එසේම වැන්ඩපූටන් පවුලේ නිල ලාංඡනය ද මෙම සිතුවම්හි දැකගත හැකි අතර බෙන්ජමින් වැන්ඩපූටන්ගේ ඡායාරූපය ද පැරණි ඡායාරූපයක් ලෙස හඳුනාගත හැකිය. දෙවන එලිසබත් රජිනගේ පනස්වන සංවත්සරය වෙනුවෙන් එමිල් වැන්ඩපූටන් විසින් රන් පදක්කමක් හිමිකරගෙන තිබෙන අතර එය සහතිකයක් වශයෙන් බංගලාවේ ප්‍රදර්ශනය කර තිබේ. ග්‍රැමෆෝනය දැකීමට නොහැකි වුවද බංගලාව තුළ තිබී පැරණි ග්‍රැමෆෝන් තැටි දැකගත හැකි අතර බොහෝ තැටිවල සිංදු ඉංග්‍රීසියෙන් පටිගත කර තිබේ. බංගලාවෙන් පිටත එංගලන්තයෙන් ගෙන්වන ලද පැරණි සිග්නල් කණුවක් හා විදුලි ජනක යන්ත්‍රයක් දැකගත හැකිය. විදුලි ජනක යන්ත්‍රය එංගලන්තයේ "ආර්.ඒ ලිස්ටර්" සමාගමේ නිශ්පාදනයකි. තවද බංගලාවේ විදුලිය භාවිතය උදෙසා අතින් ක්‍රියාකල හැකි ස්විචයක් භාවිත කර තිබෙන අතර එය "බෙන්ටෙක්" සමාගමෙන් නිර්මාණය කර තිබේ. උණු ජලය ලබා ගැනීම උදෙසා වීනට්චට්ටි වලින් නිමවන උඳුනක් එංගලන්තයේ " බාතටර්"සමාගමෙන් ගෙන්වා තිබේ. එසේම වතුර ලබා ගැනීම උදෙසා භාවිත කරන ලද යකඩ බට මුල් අවධියේ දී"ආර්.ඒ ලිස්ටර්" සමාගමෙන් ගෙන්වා තිබේ. මීට අමතරව හල්ගොල්ල කර්මාන්තශාලාවේ පවතින රබර් ඇතිරිලි සකසන රෝල් යන්ත්‍ර "බ්‍රවුන් සහ පෞද්ගලික" සමාගමෙන් නිමවා ගෙන්වා තිබේ. වතුයායට හා බංගලාවට ප්‍රවේශ වීම උදෙසා පවතින මාර්ග තැලීමට ගල්, යකඩ හා සිමෙන්තියෙන් නිමවූ ප්‍රමාණ ත්‍රිත්වයක තැලීමේ යන්ත්‍ර ක්ෂේත්‍රයේ පැවතිනි.

## සමාලෝචන

ඒ අනුව පැහැදිලි වන්නේ හල්ගොල්ල බංගලාව ඇතුළත සහ පිටත යටත් විජිත අවධියට අයත් කාර්මික උරුම රාශියක් අදවන විට ශේෂව පවතින බවය. එම උරුමයන් යටත් විජිත අවධියේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිර්මාණය වූ අනෙකුත් බංගලාවන් හා සැසඳීමේ දී එකිනෙකට වෙනස් ලක්ෂණයන් රාශියකින් යුක්ත බව අධ්‍යයනය මඟින් නිගමනය කිරීමට හැකි විණි.

## ආශ්‍රිත මූලාශ්‍රය

වැන්ඩපූටන්, එමිල්. (2025). හල්ගොල්ල වතු බංගලාව පිළිබඳව. ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සි. ජයසිංහ, 2025 අප්‍රේල් 10

වැන්ඩපූටන්, මැණිකා. (2025). හල්ගොල්ල වතු බංගලාව පිළිබඳව. ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සි. ජයසිංහ, 2025 ජුලි 23

රාජා, එස්. හේමන්ත, ඩබ්. එම්. සහ රවින්ද්‍ර. (2025). හල්ගොල්ල වතු බංගලාව පිළිබඳව. ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සි. ජයසිංහ, 2025 මැයි 03